# Path to Success – Study Pack

## තෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## ඉතිහාසය - 6 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාල - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී.ඉරෝෂිනී කේ. පරණගම මිය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ. පී. සිල්වා මයා

නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( අධ්‍යාපන සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

කේ.එල් නිල්මිණී පෙරේරා මෙය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යා )


**සම්පත් දායකත්වය**

- සෝමා දීගල්ල මිය - ගුරු උපදේශක (සමාජ විද්‍යා - කැලණිය කොට්ඨාසය)
- එම්.පී.උදයංගනී මිය - හුණුපිටිය බණ්ඩාරනායක ම.වි.

# ඉතිහාසය කෙටි සටහන්

## 6 ශ්‍රේණිය - තෙවන වාරය

### දුටුගැමුණු රජතුමා







- දුටුගැමුණු රජතුමා බුද්ධිමත් කාර්යශූර පාලකයෙකි .
- දුටුගැමුණු රජතුමාගේ මව විහාර මහා දේවියයි .
- පියා කාවන්තිස්ස රජතුමා ය.
- සහෝදරයා තිස්ස කුමරු ය.
- මාගම රාජධානිය කොටගෙන කාවන්තිස්ස රජු රජකම් කළේ ය. (එකල මෙම ප්‍රදේශය රුහුණු රට නම්විය )

- එකල අනුරාධපුර පාලනය කළේ එළාර නම් ද්‍රවිඩ රජකෙනෙකි.
- එළාර රජු ධාර්මික පාලකයෙකි .
- මාතොට වරායේ වෙළඳාමෙන් සහ ගොවිතැනින් ලැබුණු ආදායම එළාර රජු ලබා ගන්නා ලදී

- දුටු ගැමුණු කුමරු තමා වැඩිහිටි වූ පසු අනුරාධපුර පාලනය කිරීමට ඉටා ගත්තේ ය.
- අවශ්‍ය පසුබිම කාවන්තිස්ස රජතුමා විසින් ගොඩනගා තිබුණි.
- ඒ සඳහා සුදුසු සක්තිමත් පිරිසක් සකස් කොට ආහාර සුලබ කිරීමට ද කටයුතු කළේ ය.
- දුටුගැමුණු කුමරුගේ සොහොයුරු තිස්ස කුමරු දිඝාමඩුල්ල ප්‍රදේශයට යවා එහි වගා බිම් කරවීය.
- දුටුගැමුණු රජු එළාර රජු සමඟ සටන් කළේ විජිතපුර යෙදී ය.
- මෙරට 44 විරුද්ධ පාලනය කළ එළාර රජතුමා පැරද වීමට දුටුගැමුණු රජතුමාට හැකිවිය.

එතුමාගේ ආදර්ශ පාඨය වූයේ

"මාගේ මේ උත්සාහය හුදෙක් රජ සැප පිණිස නොව බුදු දහමේ චිරස්ථිතිය සඳහා ය."

- දුටුගැමුණු රජතුමාට දක්ෂ බුද්ධිමත් සේනාපතිවරු දස දෙනෙක් සිටියහ.
- ඔවුන් දස මහ යෝධයන් නම් වෙයි.
    - නන්දිමිත්‍ර
    - සුරනිමල
    - මහසෝන
    - ගෝඨයිම්බර
    - ථෙර පුත්තාභය
    - භරණ
    - වේළු සුමන
    - ලභියවසභ
    - ඛඤ්ජදේව
    - ඵුස්සදේව
- එතුමාට සිටි ඇතා කණ්ඩුල නම් විය.

## දුටුගැමුණු රජුගේ ශාසනික සේවාව

- වෙහෙර විහාර ඉදි කිරීම -

    රුවන්වැලි සෑය - (වැඩ අවසන් කරන ලැබුවේ සද්ධාතිස්ස රජු විසිනි)

    ලෝවාමහාපාය

    මිරිසවැටිය

    දුටුගැමුණු රජතුමා වෙහෙර විහාර අනූ නවයක් ඉදිකළ බව සඳහන් වේ.


- එතුමා සතුරන්ටත් ගරු කළ ශ්‍රේෂ්ඨ රජකෙනෙකි
- එළාර රජතුමා මියගිය පසු ආදාහනය කළ සොහොන් අසලින් යන විට ඊට ගෞරව කළ යුතු බවට අණ කිරීමෙන් ම පැහැදිලි වේ.

## දුටුගැමුණු රජුගේ චරිතයේ ආදර්ශ :-

- යම් අරමුණක් ඉටු කර ගැනීමට දුෂ්කර වුවත් කාලයක් තිස්සේ සැලසුම්කොට එය ඉටුකර ගත හැකිය.
- බුද්ධිමත් ලෙස හා ධෛර්යයවන්තව ක්‍රියා කිරීම .

- ආගමට හිතවත් රටට ආගමට හිතවත් වීම
- ගරු කළ යුත්තන්ට ගරු කිරීම
- රටවැසියන්ට ආදරය කිරීම

## වළගම්බා රජතුමා




පියා :- සද්ධාතිස්ස

සොහොයුරා:-

ථුල්ලත්ථන

ලජ්ජතිස්ස


බල්ලාටනාග

බිසව :- සෝමා දේවිය

වළගම්බා රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග :-

- දකුණු ඉන්දියාවෙන් පැමිණි ක්‍රමණිකයන්ට මුහුණ දීමට සිදුවීම
- තිස්ස නම් බ්‍රාහ්මණයාගේ කැරැල්ලට මුහුණ දීමට සිදුවීම.
- බැමිණිතියා සාය නම් දුර්භික්ෂය ට මුහුණ දීමට සිදු වීම.

- වළගම්බා රජතුමාට උදව් කළේ කුපික්කලතිස්ස නම් භික්ෂූන් වහන්සේ නමකි.
- ඊට කළගුණ සැලකීමක් වශයෙන් අභයගිරි විහාරය ඉදිකර එම ස්වාමීන් වහන්සේට පූජා කරන ලදී අභයගිරි විහාරය අන්තර් ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් විය.





## වළගම්බා රජුගේ කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් ;-

- මාතලේ අළු විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම (බුද්ධ ධර්මය පොත්පත්වල ලිවීම)

එතුමාගේ නම කොටවන ලද සෙල්ලිපි හමු වී තිබේ

- භික්ෂූන් වහන්සේලාට ගල්ගුහා පූජා කිරීම .
- සෙල්ලිපි වල එතුමා පිත රජ නමින් හඳුන්වා ඇත.( එයට හේතු වූයේ බල්ලාටනාග රජු මිය ගිය පසු එතුමාගේ පුත් කුමරා පියෙකු මෙන රැකබලා ගත් නිසාය. සෙල්ලිපි වල පිතුරාජ, පිතමහරජ, පිත රජ ලෙස හඳුන්වා තිබේ.)

වළගම්බා රජතුමාගේ බිසව සෝමා දේවිය වීර කාන්තාවකි දකුණු ඉන්දියාවෙන් පැමිණි පිරිසකගෙන් රජතුමාට කරදර පැවැති කාලයේ බිසව රජුගේ ආරක්ෂාව වෙනුවෙන් සතුරන් ඉදිරියට ගියාය. ඒ බිසව දකුණු ඉන්දියාවට රැගෙන ගෙන ගියහ .

## වළගම්බා රජුගේ සේවාවන් :-

- දකුණු ඉන්දියාවට රැගෙන ගිය සෝමා දේවිය නැවත කැඳවා අගබිසව තනතුරට පත් කර ගැනීම.
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
- වෙහෙර විහාර ඉදිකිරීම පිරිවෙන් ඉදිකිරීම.
- සෝමා දේවිය සතුරන් ඉදිරියට ගිය තැන සිහි වීම සඳහා සෝමාරාමය නමින් විහාරයක් කරවීම.

වළගම්බා රජුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ

- කොතරම් බාධක පැමිණියත් ඉවසිලිවන්ත ව ඒවාට මුහුණදීම.
- රට වෙනුවෙන් කටයුතු කිරීම.
- දූරදක්නා නුවණින් කටයුතු කිරීම.

## වසභ රජතුමා



- ළමා කාලය ගතකර ඇත්තේ මාමා කෙනෙක් ළගය.
- එතුමා ලම්බකර්ණ රාජ වංශයට අයත්ය .
- අතීතයේ ලේඛන කටයුතු භාරව සිටියේ ලම්බකර්ණ වරුය.
- ලම්භකර්ණ පෙළපතේ ආරම්භක රජු ය.
- රාජ්‍ය කාලය වසර හතළිස් හතරකි .

## වසභ රජුගේ සේවාවන් :-

- වැව් ඉදිකිරීම - එතුමා විශාල ප්‍රමාණයේ වැව් 11 ක් ඉදිකර ඇත.
- ඇළ මාර්ග 12ක් ඉදිකර ඇත. සැතපුම් සියයක් දුරට ජලය ගෙන යන ඇළහැර ඇළ එතුමාගේ නිර්මාණයකි.

| පැරණි නම් | වර්තමාන නම් |
|---|---|
| මයෙන්ති වැව | මහවිලච්චිය වැව |
| මානාකැටි වැව | මානන්කැටිය වැව |
| වාත මංගණ වැව | නොච්චිපොතාන වැව |

- නාන පොකුණු වලට ඇළවල් මගින් ජලය ගෙන යාම වෙනුවට පොළොව යටින් තැනූ නළ මාර්ගයෙන් ජලය ගෙන යාම හෙවත් උමං ජල මාතිකා ක්‍රමයක් වසභ රජු හඳුන්වා දුන්නේ ය.
- රට පාලනය පහසු වීම සඳහා ශ්‍රී ලංකාව ප්‍රදේශවලට බෙදා ඒවා මෙහෙයවීමට රජයේ නිලධාරීන් පත් කර ඇත.

උදාහරණ යාපනය ප්‍රදේශය ඉසිගිරි ඇමැතිවරයාට පැවරීම

| |
|---|
| මේ පිළිබඳව වල්ලිපුරම් රන්පතෙහි ලියා තිබේ. එයට එම නම ලැබෙන්නේ යාපනයේ වල්ලිපුරම් නම් ස්ථානයෙන් එය සොයාගත් නිසාය. එහි සඳහන් වන්නේ පියංගුක තිස්ස නමින් විහාරයක් ඉසිගිරිය ඇමතිවරය යාපනය ප්‍රදේශයේ දී ඉදි කළ බවයි. |

- අනුරාධපුර නගරයේ ආරක්ෂාවත් අලංකාරයත් වැඩිදියුණු කිරීමට රජතුමා කටයුතු කළේය.

  අනුරාධපුර නගරය වටා ප්‍රාකාරයක් ඉදිකර වීම.
  නගරයේ තැනින් තැන වැව් පොකුණු ඉදිකිරීම.
  ඒවාට වැව් වලින් ජලය ගලා යාමට සැලැස්වීම.
  ඒවායේ හංසයින් ඇතිකරවීම.

බුදු දහමේ දියුණුවට වසභ රජතුමා ගත් ක්‍රියාමාර්ග :-

- ථූපාරාම දාගැබ වටා වටදාගෙයක් ඉදිකිරීම.
- ඉසුරුමුණි විහාරයේ පොහොය ගෙයක් ඉදි කරවා භික්ෂූන් වහන්සේලාට පූජා කිරීම.
- තිස්සමහාරාමයේ සිතුල්පව්ව විහාරයේ දාගැබක් ඉදිකර වීම.
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
- රටවැසියන්ගේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම.
- එතුමාගේ විශිෂ්ට සේවාවක් රජය දේපල පරිස්සමෙන් භාවිතා කිරීමට රට වැසියන් උනන්දු කරවීම.
- ඒවා නඩත්තු කිරීමට අවශ්‍ය නිසා රජතුමා බදු අය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම.

වසභ රජතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ :-

- ධෛර්යවන්ත බව
- දුරදක්නා නුවණ
- විමසිලිමත් ව කටයුතු කිරීමේ ගුණය

## මහසෙන් රජතුමා





පියා - ගෝඨාභය රජතුමා

සොහොයුරා - ජෙට්ඨතිස්ස කුමරු

රාජ්‍ය කාලයේ අවුරුදු 27කි

මහසෙන් රජතුමාගේ සේවාවන් :-

- කෘෂි කර්මාන්තය දියුණු කිරීමට විශාල සේවයක් කිරීම.
- වැව් දහසයක් හා ඇළ මාර්ගයක් ඉදිකිරීම .

  මින්නේරි වැව ඒඅතර ප්‍රධාන වේ. එහි බැම්ම සැතපුම් එකයි කාලක් දිගය.
  විශාලත්වය අක්කර 4670කි .එය අතීතයේ දී “මිණිහිර වැව” නම්විය.

| පැරණි නම | වර්තමාන නාමය |
|---|---|
| මිණිහිර වැව | මින්නේරිය වැව |
| වල්ලුර වාපී | හුරුළු වැව |
| බානු වැව | කනදරා වැව |



- විහාර ආරාම ඉදි කිරීම.

  අනුරාධපුර ජේතවනාරාමය ජේතවනාරාමය තුළ බුදුරජාණන් වහන්සේගේ පටි ධාතුව නිදන් කොට ඇතැයි විශ්වාස කෙරේ.මින්නේරි විහාරය,ගොකණ්ණ විහාරය, ඒකාපිල්ල විහාරය, දාසෙන්ගල විහාරය ඉදිකිරීම.
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරවීය.
- භික්ෂූන් වහන්සේලාට සිවුරු පිරිකර පූජා කළේය

මහසෙන් රජතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ :-

රටවැසියන්ට අවංකව සේවය කිරීම

තමන්ගේ රටට සේවය කිරීම

අධිෂ්ඨානශීලී වීම.

පහත සඳහන් අභ්‍යාස වලට නිවැරදි පිළිතුරු ලියන්න

දුටුගැමුණු රජතුමා

1. දුටුගැමුණු රජතුමාගේ මව සහ පියා නම් කරන්න.
2. ජීවත් වූ ප්‍රදේශය කුමක්ද?
3. දුටුගැමුණු රජුගේ සහෝදරයා කවුද?
4. දිගාමඩුල්ල ප්‍රදේශය වර්තමානයේ හඳුන්වන නම කුමක්ද?
5. අනුරාධපුර යුගයේ දී වෙළෙඳ කටයුතු වලින් සරු ආදායමක් ලැබුණු වරාය කුමක්ද?
6. දුටුගැමුණු රජතුමා රජවීමට පෙර අනුරාධපුර පාලනය කරන ලද රජතුමා කවුරුන්ද ?
7. දුටුගැමුණු කුමරු හා එළාර රජු මුණ ගැසී සටන් කළ ස්ථානය ලෙස සැලකෙන්නේ කොහේ ද? 8.
8. දුටුගැමුණු රජතුමාගේ දක්ෂ සෙන්පතිවරු නම් කරන්න.
9. දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරන ලද ආගමික සිද්ධස්ථාන මොනවා ද?
10. දුටුගැමුණු රජතුමාගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණ තුළින් ඔබට ගත හැකි ආදර්ශ මොනවාද?

වලගම්බා රජු

11. වළගම්බා රජුගේ පියා සොයුරා සහ බිසව නම් කරන්න.
12. වළගම්බා රජුගේ පාලන කාලයේ දී ඇති වූ සතුරු බලපෑම් මොනවාද ?
13. මෙතුමාගේ පාලන කාලය තුළ සිදු වූ වැදගත් කම් වැදගත්ම සිදුවීම කුමක්ද ?
14. ?වලගම්බා රජු සමයෙහි රටෙහි ඇති වූ අපදාව කුමක්ද
15. එම ආපදා බුදු දහමට බලපෑවේ කෙසේද ?
16. රජු විසින් බුදු සසුනට හා රටට කල සේවාවන් මොනවාද ?
17. රජු පිතු රාජ නමින් හැඳින්වෙන්නේ ඇයි?
18. වළගම්බා රජුගේ බිසව ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
19. වළගම්බා රජුගේ ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ මොනවාද?
20. සෝමා දේවියගේ ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ මොනවාද?
21. අභයගිරිය පිළිබඳව කෙටි සටහනක් ලියන්න.

වසභ රජතුමා

22. වසභ රජු කුඩා කල ඇති දැඩි කළේ කවුරුන්ද ?
23. මෙතුමා කුමන වංශිකයෙක් ද ?
24. මෙම වංශයට පැවරීමේ පැවරී තිබූ රාජකාරිය කුමක්ද?
25. රට වැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට රජු ඉටුකළ සේවාවන් මොනවාද ?
26. රජුගේ ඉංජිනේරුවරුන් රටට හඳුන්වා දුන් නව තාක්ෂණය කුමක්ද?
27. රජු රට පාලනය කිරීම පහසු වීමට ගත් පියවර කුමක්ද?
28. වල්ලිපුරම් රන් පත්තිරුවේ ලියා ඇත්තේ මොනවාද?
29. එය එම නමින් හැඳින්වෙන්නේ ඇයි ?
30. අනුරාධපුරයේ ආරක්ෂාවට හා අලංකරණයට වසභ රජු ගත් පියවර මොනවාද?
31. වසභ රජු බුදුදහමේ දියුණුවට කළ සේවාවන් මොනවාද?
32. රජයේ දේපල අර පරිස්සමෙන් භාවිතයටත් ඒවා නඩත්තු කිරීමටත් රජු යෙදූ උපක්‍රමය කුමක්ද?
33. වසභ රජු වසර කීයක් රජකම් කළේ ද ?
34. වසභ රජුගෙන් ඔබට ගතහැකි ආදර්ශ පෙළගස්වන්න.

මහසෙන් රජතුමා

35. මහසෙන් රජුගේ පියා සහ සොහොයුරා නම් කරන්න.
36. මෙතුමා කරවූ වැව් සහ ඇළ මාර්ග සංඛ්‍යාව කීය ද ?
37. මහසෙන් රජු ඉදිකල වැව් වල නූතන නම හා පුරාණ නම ලියන්න.
38. මෙම රජු ඉටුකළ ආගමික සේවාවන් මොනවා ද?
39. මහසෙන් රජු දෙවියකු ලෙස ජනතාව හැඳින්වූයේ ඇයි?
40. මෙතුමාගෙන් ඔබ චරිතයට ගත හැකි ආදර්ශ ගොනු කර දක්වන්න.
41. ජේතවන දාගැබ තුළ ඇති පූජනීය වස්තුව කුමක්ද?
42. මින්නේරිය වැව පිළිබඳව වාක්‍ය තුනක් ලියන්න.
43. ජේතවන දාගැබ පිළිබඳව වාක්‍ය තුනක් ලියන්න.